# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 1 දරන
# පොලිස් කොමිෂන් සභා පනත

---

[සභාතිකය සටහන් කළේ 1990 ජනවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජනවාරි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1990 අංක 1 දරන පොලිස් කොමිෂන් සභා පනත

[සහතිකය සටහන් කළේ 1990 ජනවාරි මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 22/89.

**ජාතික පොලිස් කොමිෂන් සභාවක් සහ එක් එක් පළාත් සභාව සඳහා පළාත් පොලිස් කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික හෝ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 1 දරන පොලිස් කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

2. (1) (අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කළ යුතු වූ පොලිස්පතිවරයාගෙන් ; **ජාතික පොලිස් කොමිෂන් සභාව.**

(ආ) ජනාධිපතිවරයා විමසා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන එක් තැනැත්තකු ගෙන් ; සහ

(ඇ) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් නම් කරනු ලබන එක් තැනැත්තකුගෙන්

සමන්විත ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුතු ය.

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ නම්, ඔහු ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නම් කරනු නොලැබිය යුතු අතර, ඔහු එවැනි සාමාජිකයකු ලෙස කටයුතු කර ගෙන යාම නොකළ යුතු ය.

(3) අසනීපයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා, නම් කරනු ලැබූ කිසියම් සාමාජිකයකුට තම කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා නම් කිරීමේ බලධරයා විසින් වෙනත් යම් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නම් කරනු ලැබූ පොලිස් කොමිෂන් සභාවේ සෑම සාමාජික යකු ම, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අග්‍ර විනිශ්චයකාරවරයා හෝ වෙත තම අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලක් මගින්, තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුව හොත් මිස, ඔහු නම් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

2—ඩී 006093—11,310 (89/10)

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නම් කරනු ලැබීමට පෙර රාජ්‍ය නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව හෝ සිටියා වූ, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නම් කරන ලද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකුම, නම් කරන ලද දිනයේ සිට එම ධුරය දැරීම අවසන් කළ යුතු ය. තවද, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටින තාක් කල් කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් තම කාර්ය යන් ඉටු කිරීමෙහි ලා හානිකර ලෙස බලපෑහැකි යම් රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක හෝ ව්‍යාපාරයක නිරත වීම නතර කළ යුතු ය.

(6) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකුට, පාර්ලිමේන්තුව මගින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සාමාජිකයකු වෙත ගෙවනු ලබන දීමනාව, ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර, ඔහුගේ සේවා කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුතු ය.

(7) ජාතික පොලිස් කොමිෂන් සභාවට, එම කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සිටිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

(9) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාවෙහි යම් පුරප්පාඩුවක් තිබුණ ද, එයට, (8) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත් ව, කටයුතු කිරීමේ බලය තිබිය යුතු අතර, එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ පැවැතීමේ හේතුවෙන්, කොමිෂන් සභාවේ ක්‍රියාවක් නැත හොත් කටයුත්තක් බල රහිත නොවිය යුතු අතර, බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(10) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ කාර්යයන් සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු, රාජ්‍ය සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ජාතික අංශයට නිලධරයන්ගේ පත් කිරීම් කොමිෂන් සභාව වෙත පැවරෙන බව.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටයේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික අංශයේ පොලිස් නිලධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය, මෙයින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබේ.

බලතල පැවරීම.

4. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, එය සතු මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ සහ විනය පාලනය කිරීමේ බලතලවලින් කිසිවක්, ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික අංශයේ නිලධරයන් සම්බන්ධයෙන් වූ විට එම ජාතික අංශයේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

5. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්—

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කර්තව්‍යයන්.

(අ) ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික සහ පළාත් අංශවල නිල ධරයන් සඳහා බඳවා ගැනීමේ ක්‍රම සහ චර්යා ධර්ම සංග්‍රහ සකස් කිරීමට අදාළ සියලු කරුණු ;

(ආ) (පළාත් අංශයක සිට ජාතික අංශයකට උසස් කිරීම ඇතුළුව) එම අංශය ඇතුළත සහ එම අංශ අතර උසස්වීම් සහ මාරුවීම් කිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති වලට ; සහ ශ්‍රී ලංකා පොලිස් බලකායේ තත්ත්වයන්හි සමතාව ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා උසස්වීම් පිණිස සුදුසුකම් ලැබීමට එක් එක් තරාතිරමේ නිලධරයන් විසින් ලබාගත යුතු තත්ත්වයන්ට අදාළ වූ සියලු කරුණු ;

(ඇ) ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික අංශයේ පොලිස් නිල ධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ වූ එහි බලතල ක්‍රියාවේ යෙද වීම සහ අභිනියෝජනය කිරීම සඳහා කාර්ය පටිපාටියට අදාළ වූ සියලු කරුණු ;

(ඈ) ශ්‍රී ලංකා පොලිස් බලකායේ එක් එක් ජාතික අංශයේ විවිධ තරාතිරම් විසින් දරනු ලැබිය හැකි තුවක්කුවල, වෙඩි ද්‍රව්‍ය වල සහ උපකරණවල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණය ;

(ඉ) පළාත් පොලිස් කොමිෂන් සභාව විමසීමෙන් පසුව, ශ්‍රී ලංකා පොලිස් බලකායේ එක් එක් පළාත් අංශයේ විවිධ තරාතිරම් විසින් දරනු ලැබිය හැකි තුවක්කුවල සහ වෙඩි ද්‍රව්‍යවල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණය

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සහ තීරණය ගැනීම කරනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයන් සංඛ්‍යා සහ ඔවුන් පුහුණු කිරීම.

6. (1) ජාතික අංශයේ සියලු නිලවල පොලිස් නිලධරයන්ගේ සංඛ්‍යා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්, ජාතික පොලිස් කොමිෂන් සභාව විමසා, නියම කළ යුතු ය. එක් එක් පළාත්බද අංශයේ නිලධරයන්ගේ සහ වෙනත් නිලවල සේවක සංඛ්‍යාව—

(අ) පළාතේ වර්ග ප්‍රමාණය ;

(ආ) පළාතේ ජනගහණය ; සහ

(ඇ) එකඟවනු ලබන හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් උපමාන

කෙරෙහි සැලකිලිමත්ව පළාත්බද පරිපාලනය විසින්, ජනාධිපති වරයාගේ අනුමතය ඇතිව නියම කරනු ලැබිය යුතු ය.

මේ මූලධර්ම සියලුම පළාත්බද අංශ කෙරෙහි ඒකාකාරී ලෙස අදාළ විය යුතු ය.

(2) ජනගහනය, වර්ග ප්‍රමාණය, පොලිස් ස්ථාන සංඛ්‍යාව යනාදිය සහ වෙනත් අදාළ කරුණු කෙරෙහි සැලකිලිමත්ව, නිර්ණය කරනු ලබන ප්‍රතිපත්ති මත, පළාත් බද අංශවල සේවක සංඛ්‍යාව නිශ්චය කළ යුතුය. මේ ප්‍රතිපත්ති සියලුම පළාත්බද අංශ කෙරෙහි වෙනසක් නොමැතිව අදාළ විය යුතු ය.

(3) ජාතික සහ පළාත්බද අංශවල විවිධ නිලවල නිලධාරීන් භුක්ති විඳින වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක ලාභ පළාත්වල ප්‍රධාන අමාත්‍යවරයන් විමසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. පළාත්බද අංශවල සාමාජිකයන් විසින් භුක්ති විඳිනු ලබන වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක ලාභ සියළුම පළාත්බද අංශ කෙරෙහි ඒකාකාරී ලෙස අදාළ විය යුතු ය.

(4) ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික සහ පළාත් අංශවලට අලුතෙන් බඳවාගන්නා සියලු තැනැත්තන් සහ එම අංශවල සාමාජිකයන් පුහුණු කිරීමේ වගකීම, ජාතික පොලිස් කොමිෂන් සභාව විමසා, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් දැරිය යුතු ය. අවශ්‍යයයි ජනාධිපතිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, යම් පළාත් අංශයක සාමාජිකයන් සඳහා විකල්ප පුහුණුවක් ලබාදීමට ඔහු විසින් විධිවිධාන සැලැස්විය හැකි ය.

අභියාචනය.

7. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, 4 වන වගන්තිය යටතේ ස්වකීය බලතල පවරනු ලැබ ඇති ජාතික අංශයේ යම් නිලධරයකු විසින් කරන ලද මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ හෝ විනය කාරණයකට අදාළව කරන ලද වෙනත් යම් නියමයක් හෝ සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකුට, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු ය:

එසේ වුව ද යම් පළාත් අංශයකට මාරු කරනු ලැබුවාවූද තමාට විරුද්ධව පළාත් පොලිස් කොමිෂන් සභාව විසින් විනය ක්‍රියා මාර්ගයක් ගනු ලැබ ඇත්තාවූද පළාත් අංශයට ද්විතීයනය කරන ලද ජාතික අංශයේ යම් නිලධරයකුට ද ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියාචනා කිරීමේ අයිතිවාසිකම් තිබිය යුතු අතර එම කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය. එවැනි යම් අභියාචනයක දී පළාත් පොලිස් කොමිෂන් සභාවේ නියමය වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

අභියාචනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බලතල.

8. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 4 වන වගන්තිය යටතේ ස්වකීය බලතල පවරනු ලැබ ඇති ජාතික අංශයේ යම් නිලධරයකු විසින් කරන ලද යම් මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ නියමයක් නැතහොත් විනය කාරණයකට අදාළව කරන ලද වෙනත් යම් නියමයක් වෙනස් කිරීමේ හෝ පරිච්ඡින්න කිරීමේ හෝ බලය ජාතික පොලිස් කොමිෂන් සභාවට තිබිය යුතු ය.

පළාත් පොලිස් කොමිෂන් සභාව.

9. (1) ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් නියම කරන ලද දිනයක සිට සෑම පළාතක් සඳහා ම පළාත් පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුතු ය. විවිධ පළාත් වෙනුවෙන් විවිධ දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

(2) පළාතක, පළාත් පොලිස් කොමිෂන් සභාවක්—

(අ) එම කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ක්‍රියා කළ යුතු එම පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් ;

(ආ) ජනාධිපතිවරයා විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන් ;

(ඇ) ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තකුගෙන්

සමන්විත විය යුතු ය.

(3) අසනීපයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා නම් කරනු ලැබූ කිසියම් සාමාජිකයකුට, තම කාර්යයන් ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා නම් කිරීමේ බලධරයා විසින් වෙනත් යම් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(4) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ නම් ඔහු පළාත් පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නම් කරනු නොලැබිය යුතු අතර, ඔහු එවැනි සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යෑම නොකළ යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නම් කරනු ලැබූ, පළාත් පොලිස් කොමිෂන් සභාවක සෑම සාමාජිකයකු ම අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා හෝ වෙත තම අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලක් මගින්, තම ධුරයෙන් කලින් ඉල්ලා අස් වුවහොත් මිස ඔහු නම් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(6) පළාත් පොලිස් කොමිෂන් සභාවක සාමාජිකයකු ලෙස නම් කරනු ලැබීමට පෙර රාජ්‍ය නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව හෝ සිටියා වූ නැතහොත් පළාතක රාජ්‍ය සේවයේ ධුරයක් දැරුවා වූ හෝ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය හෝ යටතේ නම් කරනු ලැබූ පළාත් පොලිස් කොමිෂන් සභාවක සෑම සාමාජිකයකු ම, නම් කරන ලද දිනයේ සිට එම ධුරය දැරීම අවසන් කළ යුතු ය. තවද, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටින තාක් කල්, කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් තම කාර්යයන් ඉටු කිරීමෙහි ලා හානිකර ලෙස බල පෑ හැකි යම් රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක හෝ ව්‍යාපාරයක නිරත වීම නතර කළ යුතු ය.

(7) පළාත් පොලිස් කොමිෂන් සභාවක සාමාජිකයකුට එම පළාතේ පළාත් සභාව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය යුතු ය. එවැනි යම් සාමාජිකයකු වෙත ගෙවනු ලබන දීමනාව, පළාත් අරමුදලට වැය බරක් විය යුතු අතර, ඔහුගේ සේවා කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුතු ය.

(8) සෑම පළාත් පොලිස් කොමිෂන් සභාවකටම එම කොමිෂන් සභාව විසින් පත් කර ගනු ලබන ලේකම්වරයකු සිටිය යුතු ය.

(9) පළාත් පොලිස් කොමිෂන් සභාවක රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් දෙදෙනකු විය යුතු ය.

(10) පළාත් පොලිස් කොමිෂන් සභාවක සාමාජික සංඛ්‍යාවෙහි යම් පුරප්පාඩුවක් තිබුණ ද, එයට (9) වන උපවගන්තියෙහි විධිවිධාන වලට යටත්ව කටයුතු කිරීමේ බලය තිබිය යුතු අතර, එවැනි යම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ පැවතීමේ හේතුවෙන් එම කොමිෂන් සභාවේ ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් බල රහිත නොවිය යුතු අතර, බල රහිත ලෙස සලකනු නොලැබිය යුතු ය.

(11) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ කාර්යයන් සඳහා පළාත් පොලිස් කොමිෂන් සභාවක සාමාජිකයකු, රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**පළාත් පොලිස් කොමිෂන් සභාවල බලතල.**

**10.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටයේ විධිවිධානවලට යටත්ව, පළාතක, පොලිස් අධිකාරී, පළාත් අංශයේ සහකාර පළාත් පොලිස් අධිකාරී, ප්‍රධාන පරීක්ෂක, පරීක්ෂක, උප පරීක්ෂක, සාජන්ට් සහ පොලිස් කොස්තාපල් යන තනතුරුවල නිලධරයන්ගේ සහ ජාතික අංශයෙන් පළාත් අංශයට කරන ලද එම තනතුරුවල නිලධරයන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලනය ඒ පළාතේ පළාත් පොලිස් කොමිෂන් සභාව වෙත මෙයින් පවරනු ලැබේ.

බලතල පැවරීම.

**11.** (1) පළාත් පොලිස් කොමිෂන් සභාවක බලතලවලින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් බලතල අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් තැනැත්තකුට හෝ අධිකාරයකට පැවරීමට එම පළාත් පොලිස් කොමිෂන් සභාවට හිමිකම තිබිය යුතු ය.

(2) ඒ පළාතේ පළාත් පොලිස් කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ ස්වකීය බලතල පවරනු ලැබ ඇති යම් නිලධරයකු විසින් කරන ලද මාරුකිරීම් හෝ සේවයෙන් පහකිරීම් හෝ පිළිබඳ කිසියම් නියමයකින් නැතහොත් විනය කරුණකට අදාළ වෙනත් යම් නියමයකින් අතෘප්තියට පත් පළාතක පළාත් අංශයේ යම් නිලධරයකුට, එම පළාත් පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිය තිබිය යුතු ය.

ජාතික හෝ පළාත් පොලිස් කොමිෂන් සභාවකට අයුතු ලෙස මැදිහත් වීම.

**12.** ජාතික පොලිස් කොමිෂන් සභාවේ හෝ පළාත් පොලිස් කොමිෂන් සභාවක හෝ එවැනි කොමිෂන් සභාවක යම් සාමාජිකයකුගේ හෝ කිසියම් තීරණයකට, තම රාජකාරී කටයුතු කරගෙන යෑමේ දී හැර අන් ලෙසකින් තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් කෙලින්ම හෝ වක්‍ර ලෙස බලපාන්නා වූ හෝ බලපෑමට තැත් කරන්නා වූ සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය විසින් නඩු විභාග කිරීමෙන් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

වැරදි විමර්ශනය කිරීම.

**13.** (1) ශ්‍රී ලංකා පොලිස් බලකායේ පළාත් අංශයක් ආඥාක්‍රම ව්‍යවස්ථාවේ, නව වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටයෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් වැරදි නොවන සියලු වැරදි එම පළාත ඇතුළත වැළැක්වීම, හෙළිදරව් කර ගැනීම සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, එම වැරදි සම්බන්ධයෙන් අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද වගකිව යුතු ය :

එසේ වුව ද,—

(අ) එවැනි යම් වරදක් පිළිබඳ විමර්ශනය, ජාතික අංශය මගින් කළ යුතු යයි එම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ඉල්ලා සිටින අවස්ථාවක ; නැතහොත්

(ආ) එවැනි වරදක් පිළිබඳ විමර්ශනය පොදු යහපත උදෙසා ජාතික අංශය විසින් කිරීම අවශ්‍ය යයි පොලිස්පතිවරයා අදහස් කරන්නා වූ ද එම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසා නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව, ඒ වරද ජාතික අංශය විසින් විමර්ශනය කරනු ලැබිය යුතු යයි ඔහු විධාන කරන්නා වූ ද අවස්ථාවක

එම වරද ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික අංශය විසින් විමර්ශනය කරනු ලැබිය හැකි ය.

(2) ශ්‍රී ලංකා පොලිස් බලකායේ ජාතික අංශය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටයෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් සියලු වැරදි, වැළැක්වීම, හෙළිදරව් කරගැනීම සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, එම වැරදි සම්බන්ධයෙන් අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද වගකිව යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ඨයෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් වැරදි නොවන යම් වරදක් සම්බන්ධයෙන් එම පළාතේ පළාත් අංශය විසින් යම් අධිකරණයක පවරන ලද නඩු පිළිබඳව, පොලිස්පතිවරයා වෙත දැනුම් දීම, පළාතක නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ යුතුකම විය යුතු ය.

ජාතික අංශය විසින් විමර්ශන වලදී පළාත් අංශයට සහාය විය යුතු බව.

14. යම් පළාතක ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටි විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ඨයේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් නොවන යම් වරදක් වැළැක්වීම, හෙළිදරව් කර ගැනීම සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් එම පළාතේ පළාත් අංශයට සහාය වන ලෙස පොලිස්පතිවරයා විසින් ජාතික අංශයේ යම් ඒකකයකට විධාන කළ යුතු ය.

මහා නගර පොලිස් බලකාය.

15. මේ පනතේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන විෂයය යටතේ කරන ලද ආඥාවක් මගින් නිශ්චය කොට දැක්වෙන සීමා ඇතුළත, පොලිස් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කෙරෙහි බල නොපෑ යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද පොලිස් බලකාය විසින් තවදුරටත් කරනු ලැබිය යුතු ය.

පළාත් අංශය විසින් පළාතෙන් පිටත බලතල ක්‍රියාවේ යෙදවීම.

16. (1) පළාතක, පළාත් අංශයක් විසින් වෙනත් යම් පළාතක එකී බලතල හා අධිකරණ බලය ක්‍රියාවේ යෙදවීම, ඒ අනෙක් පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් එසේ කරන ලෙසට යෝජනා සම්මුතියක් මගින් එම පළාත් සභාවට බලය පවරා ඇති අවස්ථාවක, එම යෝජනා සම්මුතියේ නිශ්චිතව සඳහන් යම් සීමා කිරීම්වලට යටත්ව පොලිස්පතිවරයාගේ අනුමතිය ඇතිව කරනු ලැබිය හැකි ය.

(2) පළාතක, පළාත් අංශයේ නිලධරයකු විසින්,—

(අ) වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට බලය පවරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයකට ඒ තැනැත්තා සොයාගෙන ගොස් අත්අඩංගුවට ගැනීම කරනු ලැබිය හැකි ය; තව ද

(ආ) එම නිලධරයා සම්බන්ධව සිටින පළාත ඇතුළත සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ කරන ලද යම් වරදක් සම්බන්ධයෙන් කිසියම් විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා පොලිස්පතිවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව වෙනත් යම් පළාතක සිය බලතල හා අධිකරණ බලය ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි අතර, පොලිස්පතිවරයා විසින් ඒ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙත ඒ පිළිබඳ නිසි විධාන නිකුත් කරනු ලැබිය යුතු ය.

පළාත් අංශය ජාතික අංශයට සහාය විය යුතු බව.

17. පළාතක හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශ කරනු ලැබූ විට, ඒ පළාතේ පළාත් අංශය විසින් වැරදි විමර්ශනය කිරීමේ දී සහාය වන ලෙස පොලිස්පතිවරයා විසින් නියම කරනු ලැබූ විට, ඒ පළාත් අංශය විසින් ජාතික අංශයට එසේ සහාය විය යුතු ය.

විධාන නිකුත් කිරීමේ බලය.

18. මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීමේ දී උද්ගත විය හැකි දුෂ්කරතා කිසිවක් ඉවත් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි පොලිස්පතිවරයාට පෙනී යන්නා වූ ද කිසියම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද පරිපාලනමය විධාන පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබුවේ යම් රජයේ නිලධරයකු වෙත ද ඒ අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට අදාළව ප්‍රධාන අමාත්‍යවරයාගේ බලතල.

19. අමාත්‍යවරයා විසින්, පොලිස්පතිවරයාට අදාළව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතල නොඉක්මවන බලතල, ඒ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට අදාළව පළාතක ප්‍රධාන අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එවැනි යම් බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා ප්‍රධාන අමාත්‍යවරයා විසින් පළාතක නියෝජ්‍ය පොලිස්පතිවරයාට යම් විධානයක් කරනු ලබන අවස්ථාවක ඒ විධානය ලියවිල්ලකින් විය යුතු ය.

යම් අනනුකූලතාවක් ඇති වූ විට සිංහල පාඨය බල පැවැත් විය යුතු බව.

20. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.